සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2019

ශිල්ප කලා - I

10 ශ්‍රේණිය | කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. විවිධාකාර වූ වෘත්තීන් සමග මුසු වී ජනකලා බිහි වී ඇති අතර ඒවා වර්ගීකර ඇත්තේ,
   (1) ගොයම් කවි, ගැල් කවි, පැල් කවි ලෙස ය.
   (2) ශ්‍රව්‍ය කලා, දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය දෘශ්‍ය කලා ලෙස ය.
   (3) පාරු කවි, කරත්ත කවි, ගොයම් කවි ලෙස ය.
   (4) ජනකලා, විදග්ධ කලා, වෙස්මුහුණු කලා ලෙස ය.

02. මිරිස්ස, උඩුපිල, දෙවුන්දර යන ප්‍රදේශවල ප්‍රචලිතව පවතින ජන කලාව වන්නේ,
   (1) වෙස් මුහුණු කලාව (2) ජනකලාව
   (3) පිත්තල කර්මාන්තය (4) පන් පැදුරු කර්මාන්තය

03. මෙම ත්‍රිමාණ රූපයේ ඉදිරි පෙනුමේ හැඩතලය වන්නේ,



   (1) ඍජුකෝණාස්‍රයකි. (2) ත්‍රැපීසියමකි.
   (3) සමචතුරස්‍රයකි. (4) රොම්බසයකි.

04. ජ්‍යාමික නිර්මාණ ඇඳීමේදී විවිධ වූ රේඛා වර්ග භාවිතා කෙරේ. මධ්‍ය අක්ෂය හෝ සමමිතික බව දැන්වීම සඳහා යොද ගන්නේ,
   (1) ඝන අඛණ්ඩ රේඛා ය. (2) කඩ රේඛා ය.
   (3) දෙකෙළවර ඝන දම රේඛා ය. (4) සිහින් දාම රේඛා ය.

05. රූපයේ දැක්වෙන පරිදි අඳුරු කළ කොටස් නම් කරනු ලබන්නේ,



   (1) A - කේන්ද්‍රික කණ්ඩය B වෘත්ත පාදය
   (2) A - වෘත්ත පාදය B කේන්ද්‍රික කණ්ඩය
   (3) A - චාපය B වෘත්ත කණ්ඩය
   (4) A - වෘත්ත චාපය B කේන්ද්‍රික කණ්ඩය

06. වෘත්තයන් ඇඳි අරයෙන්ම පරිධිය සමාන කොටස් වලට බෙදීමෙන් ඡේදිත ලක්ෂ යා කර ලැබෙන ජ්‍යාමිතික නිර්මාණ වන්නේ,
   (1) ත්‍රැපීසියමකි. (2) පංචාස්‍රයකි. (3) ෂඩාස්‍රයකි. (4) ගෝලයකි.

07. පහත ජ්‍යාමිතික හැඩතල අතරින් බෝලය මැසීම සඳහා සුදුසු හැඩතලය වන්නේ,

(1)  (2)  (3)  (4) 

08. රූපයේ දැක්වෙන ජ්‍යාමිතික නිර්මාණය වන්නේ,



(1) AB රේඛාවේ සිට C ලක්ෂයට ලම්බකයක් ඇඳීම.
(2) රේඛාවේ ලම්භ සමච්ඡේදනය ඇඳීම.
(3) ඉලිප්සය නිර්මාණය කිරීමයි.
(4) AB රේඛාවේ ස්පර්ශනය නිර්මාණය

09.



රූපයේ දැක්වෙන්නේ විහිත චතුරස්‍ර යුගලය භාවිතයෙන් ගොඩනැගූ කෝණයකි. එහි ABC අගය වන්නේ,

(1) 150° කි. (2) 135° කි.
(3) 180° කි. (4) 120° කි.

10. රූපයේ දැක්වෙන්නේ ළදරු සබන් ඇසුරුමකි. එහි විකසනය පහත රූප අතරින් කුමක්ද?




(1)


(2)


(3)


(4)

11. රෙදිපිළි අලංකරණයේ ක්‍රමවේද තුනක් භාවිතා කරමින් රෙදිපිළි අලංකාර කර ගැනීම සිදු කරයි. එම ක්‍රමවේද නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) සායම් පෙවීම, ආලේපනය, ගැල්වීම ය.
(2) සායම් පෙවීම, ආලේපනය, මුද්‍රණ ය.
(3) සායම් ගැල්වීම, ආලේපනය, තිත් තැබීම ය.
(4) සායම් පෙවීම, සායම් ආලේපනය, සායම් දියර තැබීම ය.

12. අතීතයේ මුතුන් මිත්තන් සිතුවම් ඇඳීම සහ නූල් වර්ණ ගැන්වීම සඳහා දායකකරගත් පාෂාණ වර්ගයකි.
(1) හිරිගල් පාෂාණය. (2) කෙබලනයිට් පාෂාණය
(3) මයිකාමය පාෂාණය (4) කෙරයාලනයිට් පාෂාණය

13. වෛවර්ණයෙන් යුතු සියලු වර්ණ සැකසීම සඳහා දායක වන වර්ණ සංකලනය වන්නේ,
(1) ද්විතීයික වර්ණය (2) මූලික වර්ණය
(3) මොනෝක්‍රෝම් වර්ණය (4) සම්මිශ්‍රණ වර්ණය

14. මහා පරිමාණ කම්හල්වල හා ගෘහස්ථ රෙදිපිළි මුද්‍රණයේ දී පෙර පිරියම් ක්‍රම ලෙස භාවිතා කරන ක්‍රම වන්නේ,
(1) කැඳහරණය, මැදීම, වීරංලනය (2) කැඳහරණය, මලහරණය, වීරංජනය
(3) සේදීම, වේලීම, මැදීම ය. (4) පෙගවීම, සේදීම, වේලීම ය.

15. පින්තාරු කලාවේදී සම්මත උපකරණ භාවියෙන් තොරව සිදුකරන ශිල්පීය ක්‍රම හඳුන්වන්නේ,
(1) සරල පින්තාරු ලෙස ය. (2) උපකරණ සහිතව කරන පින්තාරු ලෙස ය.
(3) විසිතුරු පින්තාරු ලෙස ය. (4) උපකරණ රහිතව කරන පින්තාරු ලෙස ය.

16. ට්‍රාන්ස්පේරන්සි කඩදාසි, මෝස්තර රටාව, පැන්සල, තියුණු කැපුම් තලයක් යන ද්‍රව්‍ය හා උපකරණ භාවිතා කරන්නේ කුමන අලංකරණ ක්‍රමයක් සඳහා ද?
(1) බතික් මුද්‍රණ සඳහා ය. (2) සේද රාමු මුද්‍රණය සඳහා ය.
(3) සිදුරු තහඩු මුද්‍රණ සඳහා ය. (4) අච්චු මුද්‍රණය සඳහා ය.

17. පෙහෙකම් කෙඳි වර්ගීකරණයේ දී ප්‍රෝටීන් කෙඳි කාණ්ඩයට අයත් කෙඳි වර්ග වන්නේ,

(1) ජුට්, සිසල්, සේද ය.
(2) සේද, ලෝම ය.
(3) නයිලෝන්, ටෙරලින් ය.
(4) රන්, රිදී ය.

18. පහත වියමන් රටා අතරින් ජටා වියමන තෝරන්න.



(1) (2) (3) (4)

19. මැටි නිර්මාණය පිළිබඳ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) පාෂාණ දිරාපත් වී මැටි සෑදේ.
(2) ඇලුමිනා සිලිසේට් දිරාපත් වී මැටි සෑදේ.
(3) ජිප්සම් දිරාපත් වී මැටි සෑදේ.
(4) හිරිගල්, කළුගල්, දිරාපත් වී මැටි සෑදේ.

20. මැටි හඳුන්වනු ලබන රසායනික නාමය වන්නේ,

(1) ෆෙල්ස්ඩ්පාර්
(2) ඇලුමිනා සිලිකේට්
(3) ඇලුමිනියම් ඔක්සයිඩ්
(4) කාබන්ඩයොක්සයිඩ්

21. නම්‍යතා ගුණයෙන් අඩු මැටි වන්නේ කිනම් මැටි වර්ගයද?

(1) ද්විතියක මැටි (2) රතු මැටි (3) බෝල මැටි (4) ප්‍රාථමික මැටි

22. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් පසු සුදු පැහැයක් ගන්නා මැටි වර්ගය කුමක්ද?

(1) ශේෂ මැටි (2) කෙඹලින් (3) බෝලමැටි (4) රතුමැටි

23. මැටිවල ගුණාංගයකි සච්ඡිද්‍රතාව. සච්ඡිද්‍රතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(1) ඇලෙන සුළුබව
(2) භාණ්ඩයේ පරිමාව අඩුවීම.
(3) සිදුරු සහිතබව
(4) වර්ණය වෙනස්වීම.

24. පෝසිලේන් භාණ්ඩ සෑදීමට වඩාත් සුදුසු කාච සහ පසුබිම් ආකාරයෙන් පිහිටා ඇති කෙඩලින් මැටි නිධිය පිහිටා ඇත්තේ,

(1) මටියාගොඩ (2) බොරලැස්ගමුව (3) දෙදියවල (4) මොලගොඩ

25. උළු, ගඩොල්, වළං සෑදීම සඳහා වැඩි වශයෙන් භාවිත කරනු ලබන මැටි වර්ගය කුමක්ද?

(1) කෙබලින් (2) රතුමැටි (3) ගිනිමැටි (4) ඩොලමයිට්

26. උළු කර්මාන්ත ශාලාවල බිම් උළු නිෂ්පාදනයට මැටි මිශ්‍රණය සකසා ගනු ලබන්නේ,

(1) තෙත මැටි වශයෙනි.
(2) දියර මැටි වශයෙනි.
(3) වාත්තු දියර වශයෙනි.
(4) වියළි මැටි වශයෙනි.

27. අච්චු තුළට මැටි දියර වත්කර භාණ්ඩ තැනීම හඳුන්වනුනේ,

(1) ඇඹීම.
(2) ඉදිකිරීම
(3) වාත්තු කිරීම.
(4) තහඩු භාවිතා කර සෑදීම.

28. ග්‍රොග් යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(1) කැබලිනි කුඩුය. (2) හුණුගල් කුඩුය. (3) තිරිවානා ගල් ය. (4) ක්වාට්ස් ය.

29. රිබන් මෝස්තර මැසීමේදී එම්බ්‍රොයිඩර් රාමුව භාවිතා කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?
(1) අලංකාරව මසා ගැනීම. (2) රෙද්දේ රැළි වැටීම වළක්වා ගැනීම.
(3) වර්න ගලපා ගැනීමේ පහසුව (4) ඉඳි කටු ගසා තබා ගැනීම.

30. රිබන් එම්බ්‍රොයිඩර් කිරීමේදී අයිඩා රෙදිවල මැසීම සඳහා භාවිතා කරන ඉඳි කටුව කුමක්ද?
(1) මොටතුඩ සහිත ඉඳිකටුව (2) උල් සහිත ඉඳිකටුව
(3) සාමාන්‍ය ඉඳි කටුව (4) ඉහත සියලුම ඉඳිකටු

31. පැච් වර්ක් නිර්මාණ කිරීමේදී රෙදි කැබලි දෙකක් එකට සම්බන්ධ කිරීමට යොදා ගන්නා මැහුම් ක්‍රමයකි.
(1) ලේසි ඩේසි මැස්ම (2) බ්ලැන්කට් මැස්ම (3) විස්මේන්තු මැස්ම (4) රිබන් මැස්ම

32. පැච්වර්ක් නිර්මාණ කිරීමේදී රෙදි අපතේ යාම වළක්වා ගැනීම සඳහා කළ හැකි කාර්යය වන්නේ,
(1) රෙද්ද නමා කැපීම (2) රෙද්දේ කෙළවරක සිට කැපීම.
(3) පතරොමක් භාවිතා කිරීමෙන් කැපීම. (4) රෙද්දේ මතුපිට කැපීම.

33. සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණය කිරීමේදී පිරවුම් මාධ්‍ය වශයෙන් භාවිතා කරන්නේ මොනවාද?
(1) රෙදි, පුළුං (2) පුළුං, පොලිෆිල් (3) ලී කුඩු, පැඩින් (4) රෙදි කැබලි, ලී කුඩු

34. උසස් නිමාවකින් යුත් එළදායි සැහැල්ලු සෙල්ලම් බඩු නිර්මාණයේදී දරුවෙක් ගැන සැලකිලිමත් විය යුතු විශේෂ කරුණක් වන්නේ,
(1) කුඩා දරුවන් ප්‍රියකරන නිසා
(2) දරුවන් තුළ ප්‍රසන්නබව ඇතිවීම නිසා
(3) දරුවන්ගේ වයසට පරිණතියට ගැලපෙන නිසා
(4) නිර්මාණ ඉතා සැහැල්ලු ආකාරයෙන් සකස් කර ඇති නිසා.

35. ඉහත රූප සටහන් වලින් පෙන්වා ඇත්තේ කිනම් සුරතල් සතා නිර්මාණය කිරීම සඳහා ද?
(1) පෙන්ගුවින්
(2) ටෙඩිබෙයාර්
(3) බලු පැටියා
(4) හා පැටියා



36. වර්තමානයේ වර්ණ A4 කඩදාසි භාවිතයෙන් කරන ජනප්‍රිය කලාවක් වන්නේ,
(1) විසිතුරු නිර්මාණ (2) කොලාජ් නිර්මාණ
(3) පේපර් ක්විලින් නිර්මාණ (4) ඩෙකෝපාජ් නිර්මාණ

37. කඩදාසි පටි රෝල් කර ගැනීමට භාවිත කරන මූලය වෙනුවට යොදා ගන්නා අනුයෝගී උපකරණය වන්නේ,
(1) ගොතන කටුව (2) හර්නල් කටුව (3) ට්විසරය (4) ටූත්පික් එක

38. කඩදාසි පල්ප මාධ්‍ය භාවිත කර නිර්මාණයක් කිරීමේදී එය කෘමි සතුන්ගෙන් ආරක්ෂාවට භාවිතා කල යුත්ත් මොනවාද?
(1) පල්මානික්කම් (2) කරාබුනැටි තෙල් සහ ලින්සීඩ් ඔයිල්
(3) පොල්තෙල් (4) කපුරු කුඩු

39. පල්ප මාධ්‍ය සකස් කර ගැනමේදී බන්ධනකාරකයක් ලෙස යොදා ගන්නේ මොනවාද?
(1) මැලියම් (2) පල්මානික්කම් (3) බයින්ඩර්ගම් (4) පොල්තෙල්

40. උද්‍යාන අලංකරණ කෘති නිර්මාණයේ දී අනුගමනය කරන ක්‍රම දෙක මොනවාද?
(1) ලී කැටයම්, බීරළු (2) මූර්ති, කැටයම් (3) බීරළු, දැව (4) ලී කැටයම්, මූර්ති

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2019

ශිල්ප කලා - II

10 ශ්‍රේණිය | කාලය පැය 2 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) රේවත මධ්‍ය මහා විද්‍යාලයේ ශිල්ප කලා විෂය හදාරණ සිසුන්ගේ විෂය දැනුම පිරික්සීම සඳහා ශිල්ප කලා විෂය භාර ගුරුතුමා විසින් සිසුන් සඳහා පහත සඳහන් ආකාරයේ ප්‍රශ්නාවලියක් ලබා දී තිබුණි.

i. ජන කලාවේ ප්‍රභේදයක් වන දෘශ්‍ය කලා සඳහා උදාහරණයක් දක්වන්න.

ii. ස්වභාවික සායම් භාවිතා කොට නිර්මාණය කළ චිත්‍ර දැකිය හැකි ස්ථාන 02 ක් දක්වන්න.

iii. අමු රෙදිවල පවතින දුඹුරු පැහැය ඉවත් කිරීම හඳුන්වන නාමය කුමක්ද?

iv. මැටි නිර්මාණය වීම සඳහා මූලික වන මාතෘ පාෂාණය කුමක්ද?

v. ඔබ ඉගෙන ගත් මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රමයකට ඔබ කැමති හැඩයක් සහිත මැටි භාණ්ඩයක් රූප සටහනක් අඳින්න.

vi. විසිතුරු මැහුම් ක්‍රම 02 ක රූප සටහන් 02 ක් අඳින්න.

vii. රිබන් ආශ්‍රිත බිත්ති සැරසිල්ලක් සඳහා සුදුසු රූප සටහනක් අඳන්න.

viii. ඔබ කැමති ඇසුරුමක් සඳහා ජ්‍යාමිතික හැඩ තල සහිත රූප සටහනක් නිර්මාණය කරන්න.

ix. වෘත්ත ආශ්‍රිත නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ 02 ක් දක්වා රූප සටහන් 02 ක් අඳින්න.

x. සිමෙන්ති මධ්‍යයෙන් බිතු කැටයමක් නිර්මාණය කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

(ලකුණු 2x10=20)

(02) රූපයේ දැක්වෙන්නේ ජ්‍යාමිතික හැඩතල සහිත බෝනික්කෙගේ රූප සටහනකි.



i. මෙහි දැකිය හැකි ජ්‍යාමිතික තල රූප 02 ක් නම් කරන්න. (ල.02)

ii. බෙල්ල කොටසේ දැකිය හැකි හැඩතලයේ ත්‍රිමාණ පෙනුම අඳින්න. (ල.04)

iii. කඳ කොටසේ විකසනය අඳින්න. (ල.04)

(03) නිෂ්පාදනය කරගත් රෙදිපිළි විවිධ ක්‍රම භාවිතා කරමින් අලංකරණ කර ගැනේ.

i. සායම් භාවිතයෙන් කරනු ලබන අලංකරණ ක්‍රම 02 ක් නම් කරන්න. (ල.02)

ii. ඉහතින් ඔබ සඳහන් කළ එක් ක්‍රමයක් යටතේ ළදරු ඇඳුමක් සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න. (ල.04)

iii. ඉහත ඔබ නිර්මාණය කළ මෝස්තරයට අනුව ළදරු ඇඳුම අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(04) රෙදි නිෂ්පාදනයේ දී ස්වාභාවික සත්ව කෙඳි අතරෙන් බැටළු ලෝමවලට ප්‍රධාන ස්ථානයක් හිමි වේ.

i. ලෝම ලබාගන්නා බැටළු වර්ග 02 ක් ලියන්න. (ල.02)

ii. කෙඳි පරීක්ෂණ ක්‍රම 04 ක් නම් කරන්න. (ල.04)

iii. චාම් වියමනේ ලක්ෂණ 02 ක් දක්වා වියාගත හැකි රෙදි වර්ග 04 ක් නම් කරන්න. (ල.04)

(05) මිනිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මැටි භාවිතා කර භාණ්ඩ සාදා තිබේ.

i. ප්‍රාථමික මැටි භාවිත කර නිෂ්පාදනය කරන භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල.02)

ii. ග්‍රාමීය කර්මාන්තවල මැටි පදම් කරගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

iii. ඔබ කැමති ආකාරයකට මැටි මාධ්‍යයෙන් භාණ්ඩයක් නිර්මාණය කරගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(06) වර්තමානයෙහි වෙළඳ පොළෙහි විසිතුරු භාණ්ඩ සඳහා හොඳ ඉල්ලුමක් ඇත.

i. පැච්වර්ක් නිර්මාණ 04 ක් නම් කරන්න. (ල.02)

ii. පැච්වර්ක් නිර්මාණ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. (ල.04)

iii. පබළු භාවිතා කර බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරගන්නා ආකාරය රූප සටහන් සහිතව විස්තර කරන්න. (ල.04)

(07) වර්තමානයේ උද්‍යාන අලංකරණ නිර්මාණවලට විශේෂ තැනක් හිමි වේ.

i. උද්‍යාන මූර්ති තැබිය හැකි ස්ථාන 04 ක් ලියන්න. (ල.02)

ii. මූර්තියක් ගොඩ නැගීමේදී භාවිතා කරන ශිල්පීය ක්‍රම මොනවාද? (ල.04)

iii. ඔබ කැමති පල්ප මාධ්‍යයක් සකස් කර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය ලියා එය සාදා ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | තෙවන වාර පරීක්ෂණය 2019

10 ශ්‍රේණිය | ශිල්ප කලා

පිළිතුරු පත්‍රය - I කොටස

01. (2)	02. (1)	03. (3)	04. (4)	05. (1)	06. (3)	07. (4)	08. (2)	09. (1)	10. (4)
11. (2)	12. (1)	13. (2)	14. (2)	15. (1)	16. (3)	17. (2)	18. (4)	19. (1)	20. (2)
21. (4)	22. (2)	23. (3)	24. (1)	25. (2)	26. (4)	27. (3)	28. (1)	29. (2)	30. (1)
31. (3)	32. (3)	33. (2)	34. (3)	35. (1)	36. (3)	37. (4)	38. (2)	39. (3)	40. (2)

II පත්‍රය

(01) i. වෙස් මුහුණු කර්මාන්තය, පේෂ කර්මාන්තය, මැටි කර්මාන්තය, ලී කැටයම් ආදිය.

ii. සීගිරිය, කැලණියේ පැරණි විහාරය, දඹුලු විහාරය, දෙගල්දොරුව ආදිය.

iii. විරංජනය, සුදු කිරීම.

iv. ශෙල්ඩ්ස්පාර්

v. සුදුසු හැඩයක් සහිත නිර්මාණයක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

vi. කතිර මැස්ම, ලේස්ඩේසි මැස්ම, දම්වැල් මැස්ම ... ආදී මැහුම් ක්‍රම 02 ක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

vii. සුදුසු රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

viii. රූප සටහනක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ix. පාපිසි, බිත්ති සැරසිලි ආදිය දක්වා වෘත්ත හැඩයේ රූප සටහන් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

x. සුදුසු මෝස්තරයක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2x10=20)

(02) i. වෘත්තය, ඍජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණාණය ආදිය (ල.02)

ii. සමචතුරස්‍රයේ ත්‍රිමාණ පෙනුම / ඝනකය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. ඝනකාභයේ විකසනය නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(03) i. අච්චු මුද්‍රණය, අතින් පින්තාරුව, සේද රාමු මුද්‍රණය, ස්ටෙන්සිල් මුද්‍රණය ආදිය. (ල.02)

ii. සුදුසු මෝස්තරයක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. ළදරු ඇඳුම අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(04) i. දික්ලොම් බැටළුවා, මැරිනෝ බැටළුවා, දෙමහුන් බැටළුවා, මස් බැටළුවා (ල.02)

ii. ස්පර්ශ කිරීම, පිළිස්සීම, කෙඳි කඩා බැලීම, අන්වීක්ෂයකින් බැලීම, පල්ලම පරීක්ෂාව (ල.04)

iii. 1. දික් හරස් නූල් ළංව බැඳීම, ශක්තිමත්බව, කල් පැවැත්ම.
2. චාම් වියමනෙන් වියාගත හැකි රෙදි වර්ග 04 ක් නම් කරන්න. (ල.04)

(05) i. දන්තාලේප, බෙහෙත් දවටන, තීන්ත, තාප පරිමාණ භාණ්ඩ, පෝසිලේන් භාණ්ඩ, සෙරමික් භාණ්ඩ ආදිය. (ල.02)

ii. තෙත මැටි වශයේන පදම් කිරීම, වියළි මැටි වශයෙන් පදම් කිරීම. (ල.04)

iii. මැටි භාණ්ඩ සාදා ගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(06) i. බිත්ති සැරසිලි, කුෂන් කවර, පාපිසි, සෙල්ලම් බඩු (ල.02)

ii. 1. විවිධ වර්ණයන්ගෙන් රෙදි තෝරා ගැනීම.
2. සේදීමේදී වර්ණ වෙනස් නොවන රෙදි තෝරා ගැනීම.
3. රෙදි කැබලි අපතේ නොයාමට පතරොම් භාවිතය
4. නිර්මාණය කරනු ලබන උපාංගයක හැඩ තල තෝරා ගැනීම. (ල.04)

iii. පබළු භාවිතා කර බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (රූප සටහන් සහිතව) (ල.04)

(07) i. පොකුණක් අසල මිදුල, නිවස ඉදිරිපිට, ගෙවත්ත ඉදිරිපිට, එළිමහන් ස්ථානවල. (ල.02)

ii. පූර්ණ උන්නත, අල්ප උන්නත, අධි උන්නත (ල.04)

iii. කඩදාසි, ලී කුඩු, දහයියා, වැලි ආදිය ද්‍රව්‍ය ලියා සාදා ගන්නා ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)